# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.04.08 පැය 1210 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 680 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**පිහිණුම් තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.**

ශ්‍රී ලංකා ජලක්‍රීඩා සංගමය මඟින් සංවිධානය කරනු ලැබූ **'ජාතික ප්‍රවීනයන්ගේ දිගුදුර පිහිණුම් තරඟාවලිය'** 2025.03.30 වන දින රත්මලාන ගුවන් හමුදා පිහිනුම් තටාකයේදී පවත්වන ලදි.

මෙම පිහිණුම් තරඟාවලිය ක්‍රීඩා සමාජ 14 කින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 200 කට ආසන්න සංඛ්‍යාවක් තරඟ වැදුණු අතර ශ්‍රී ලංකා පොලිස් පිහිණුම් කණ්ඩායමේ ක්‍රීඩකයින් 51 දෙනෙකු මෙම තරඟාවලිය සඳහා සහභාගි විය. මෙහිදී **රන් පදක්කම් 35 ක්, රිදී පදක්කම් 33ක් හා ලෝකඩ පදක්කම් 24ක් දිනා ගනිමින් ප්‍රසාද ලකුණු 430 ක් ලබා ගෙන සමස්ථ ශූරතාවය ශ්‍රී ලංකා පොලිස් පිහිණුම් කණ්ඩායම දිනා ගන්නා ලදී.**

මෙම තරඟාවලියේ වයස අවුරුදු 45 – 49 කාණ්ඩය යටතේ තරඟ වැදුණු පොලිස් සැරයන් 15395 රත්නායක නිලධාරියා එම කාණ්ඩයේ ශූරයාට හිමි පදක්කම සහ වයස අවුරුදු 50 – 54 කාණ්ඩය යටතේ තරඟ වැදුණු උප පොලිස් පරීක්ෂක පී.කේ.ඩී.එන්.චාමින්ද නිලධාරියාද එම කාණ්ඩයේ ශූරයාට හිමි පදක්කම දිනා ගැනීමට සමත්විය.

පොලිස් පිහිණුම් කණ්ඩායමේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති රොෂාන් විජේසිංහ මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස සහකාර පොලිස් අධිකාරී අසිත ද සිල්වා මහතා කටයුතු කරයි. පුහුණුකරු ලෙස ප්‍රධාන පොලිස් පරීක්ෂක කේ.ඩී.එච්. විජයන්ත මහතා සහ කළමණාකරු ලෙස උප පොලිස් පරීක්ෂක එස්.සී. ජයවර්ධන මහතා කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**





**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**